# ග්‍රාමීය පාසල් දරුවන්ගේ පුස්තකාල භාවිතය (අනුරාධපුරය මහගස්වැව මහ විද්‍යාලය ආශ්‍රයෙන් කරන ලද පර්යේෂණයකි)

ජී. එම්. එන්. විජේරත්න[1]


## සංක්ෂේපය

වර්තමානයේ පවතින පාසල පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමය තුල දරුවන්ගේ බුද්ධි වර්ධනයට හා නව දැනුම සොයා යාමේදී පුස්තකාලය මගින් ඉටුවන්නේ අමිල මෙහෙවරකි. පාසලෙන් ලබාදෙන්නා වූ දැනුමට අමතරව දරුවන්ගේ ගවේෂණාත්මක අධ්‍යාපන ක්‍රමයට අඩිතාලම සපයන්නේ පුස්තකාලයයි. වර්තමානය වන විට පාසල් සිසුන් පුස්තකාල භාවිතයට හුරු වී ඇත්තේ ඉතාමක් සුළු වශයෙනි. තවද දරුවන් විෂය රාමුවකට පමණක් සීමා වී ඇති අතර පාසල් දරුවන් නව ඇනුම සොයා යාමේදී භාවිතා කරන ක්‍රමවේද මොනවාද හා පුස්තකාල භාවිතය අඩපණ වීමට බලපා ඇති සාධක විමර්ශනය මත මෙම අධ්‍යාපනයේ ගැටලුව හා අරමුණ පදනම් වී ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුණුවැව කලාප කාර්යාලයේ මහගස්වැව මහා විද්‍යාලයේ 6-13 ශ්‍රේණිවල සියලුම සිසුන්ගෙන් පුස්තකාල පරිහරණය පිළිබද සංගහන ක්‍රමවේදය මගින් පාසල් පුස්තකාලයාධිපතිතුමියගෙන් ලබාගත් තොරතුරු මත පදනම් විය. ඒ අනුව පාසලේ ඉගෙනුම ලබන පිරිමි දරුවන්ගෙන් 25% ක් පමණ පුස්තකාලය පරිහරණය කරන අතර ගැහැණු දරුවන්ගෙන් 45% ක් පමණ පුස්තකාල භාවිතයට යොමු වී තිබේ. මේ පිළිබඳ අදහස් විමසන විට පුස්තකාලයාධිපතිනියගෙන් අනාවරණය වුයේ දරුවන් ප්‍රධාන වශයෙන් කතා පොත් කියවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් උනන්දු වී ඇති අතර අධ්‍යයන කටයුතු සම්බන්ධව පොත්පත් පරිහරණය කරනුයේ ඉතා අල්ප වශයෙන් බවයි. තව දුරටත් 6 - 13 සිසුන්ගෙන් අදහස් විමසන විට ඔවුන්ගේ අදහස වුයේ පාසලෙන් ලබාදෙන දැනුමට අමතර දැනුම වෙනත් පංති මගින් ලබාගත හැකිබවත්, වෙනත් දැනුම අන්තර්ජාලය මගින් ලබාගත හැකි බවත් ය. එහිදී පුස්තකාල භාවිතය එතරම් සුවිශේෂි නොවන බවත්ය. පුස්තකාල භාවිත කරන දරුවන් අතරද විශාල වශයෙන් මේ සඳහා යොමු වී ඇත්තේ 6, 7, 8 ශ්‍රේණිවල සිසුන් වීමද වැදගත් වේ. මේ අනුව පාසල් සිසුන් බොහෝමයක් පුස්තකාලය භාවිතා කළේ අඩුවෙන් බවත් ,ඒ තුළින් කතා පොත් කියවීමට ප්‍රමුඛ ලෙස භාවිතා කරන බවද, දරුවන් විශාල වශයෙන් බාහිර පංති සඳහා යොමු වීමත්, තරඟකාරී අධ්‍යාපන ක්‍රමවේදය තුළ දරුවන් ඉතා අවිවේකී පුද්ගලයන් පිරිසක් බවට පත් වී ඇති බවද මෙමඟින් අනාවරණය විය. තවද පාසල් පුස්තකාල පද්ධතිය දරුවන්ට ප්‍රිය වු ස්ථානයක් බවට පත් කිරීමත්, පාසල් තුළින් දරුවන් පුස්තකාලය වෙත යොමු කළ යුතු බවත් මෙයින් ගම්‍ය විය.


**මුඛ්‍ය පද :** පුස්තකාල භාවිතය, පාසල් දරුවන්, අධ්‍යාපන ක්‍රමවේදය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, jeevagb@gmail.com